# මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල දෙමාපිය සංවර්ධන සමිති පිහිටුවීමේ ව්‍යවස්ථා සංග්‍රහය.

මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය - 2016

ඌව පළාත

## උපදේශකත්වය

ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය

## අනුග්‍රහය

යුනිසෙෆ් ආයතනය

## සම්බන්ධීකරණය

ආනන්දසිරි ගොඩකන්ද මයා - නිසි බලධාරී - මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය ඌව පළාත

## සම්පත්දායකත්වය

I. එස්.එන් හෙට්ටිආරච්චි මිය - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂිකා - බදුල්ල කලාපය

II. එච්.ජී.ජයතිස්ස මයා - විදුහල්පති - බ/ සිරිසුමන මහා විද්‍යාලය - බදුල්ල

III. එන්.බාලේන්ද්‍රන් මයා - විදුහල්පති - බ/සරස්වති කනිෂ්ඨ විද්‍යාලය - බදුල්ල

IV. එම්.කේ.බී.නාලිකා ප්‍රියදර්ශනි මිය - ව්‍යාපෘති නිලධාරි - කො.අ.කාර්යාලය - බදුල්ල

V. ගාමිණි අතපත්තු මයා - ව්‍යාපෘති නිලධාරි - කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - පස්සර

VI. වයි.එම්.නිමල් සමරසිරි මයා - ව්‍යාපෘති නිලධාරි - කො.අ.කාර්යාලය - සියඹලාණ්ඩුව

VII. ආර්.එම්.මංගල දේශප්‍රිය මයා - මුල් ළමාවිය සංවර්ධන සහකාර - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බඩල්කුඹුර

VIII. ආර්.එම්.සුදු බණ්ඩාර මයා - ප්‍රජා සංවර්ධන නිලධාරි - සහකාර පළාත් පාලන කොමසාරිස් කාර්යාලය - මොනරාගල

IX. කේ.එස්.සමන් මයා - ව්‍යාපෘති නිලධාරි - කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය - බුත්තල

X. ජේ.ඊ සුධීර රත්නායක මයා - දිස්ත්‍රික් මුල් ළමාවිය සම්බන්ධීකරණ නිලධාරි - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොනරාගල

# මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල දෙමාපිය සංවර්ධන සමිති පිහිටුවීමේ ව්‍යවස්ථා සංග්‍රහය

මෙම ව්‍යවස්ථා සංග්‍රහය ඌව පළාත් සභාවේ 2014 අංක 02 දරණ මුල් ළමාවිය ප්‍රඥප්තියේ IV වන කොටස (අ) වගන්තියට අනුව පත් කර ඇති උපදේශක කමිටුව වෙත 2016.06.20 වන දින ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මෙය ඌව පළාතේ **"මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා දෙමාපිය සංවර්ධන සමිති ව්‍යවස්ථා සංග්‍රහය"** ලෙස යොදා ගැනීම සුදුසු බව ඒකමතිකව අනුමත කරන ලදි.

ආනන්දසිරි ගොඩකන්ද
නිසි බලධාරි
මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය
ඌව පළාත

# ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමියගේ පණිවුඩය.

හෙට දිනයේ අනාගතය භාර ගැනීමට සිටින දරු පරපුර හැඩ ගස්වා ඔවුන් යහමගට යොමු කිරීම සමස්ත සමාජයේම වගකීම වේ.ඒ සඳහා මූලික පදනම සකස් කළ යුතු වන්නේ මුල් ළමාවියේ දීමය.මුල් ළමාවියේ දරුවන් වෙනුවෙන් සපයනු ලබන සේවාවන් වඩාත් ක්‍රමවත් කිරීමටත් උසස් ගුණාත්මක සේවාවක් ඔවුන් වෙත ලබා දීමත් අපගේ අපේක්ෂාව වේ.ජීවිතය ආරම්භ කිරිමට මූලික පියවර තබන කුඩා දරුවන් හට යහපත් අනාගතයක් උදා කරදීමේ වගකීම ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ මුල් ළමාවිය පළාත් කාර්යාලය විසින් මනාව අවබෝධ කරගෙන තිබේ.එම වගකීම ඉටු කිරීමේ අරමුණෙන් වර්තමානය වන විට මුල් ළමාවිය සංවර්ධනයට අදාළ වන ප්‍රතිපත්ති,ප්‍රමිතීන් යනාදිය සකස් කර ගෙන ඇති අතර ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් නීතිමය තත්ත්වයන් ශක්තිමත් කරලීමට ද පියවර ගනිමින් පවතී .

පළාත් මට්ටමේ කේන්ද්‍රීය ආයතන වශයෙන් සුවිශාල මෙහෙවරක් ඉටු කිරීමට බැඳී සිටින ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ මුල් ළමාවිය පළාත් කාර්යාලය මුල් ළමාවිය දරුවාගේ සමස්ත සංවර්ධනය සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ඒකාබද්ධ කරමින් ප්‍රතිපත්ති සම්පාදනය, වැඩ සටහන් සැලසුම් කිරීම,ක්‍රියාත්මක කිරීම හා සමස්ත වැඩසටහන් සම්බන්ධීකරණය වැනි විවිධ කාර්යයන් රැසක් දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලබයි.එම වැඩසටහන් අතුරින් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා සංවර්ධන කමිටු පිහිටුවීමේ වැඩසටහන ඉතා වැදගත් ක්ෂේත්‍රයක් වශයෙන් සැළකිය හැකිය.මෙම කමිටු ක්‍රියාත්මක කිරීම මඟින් දරුවන්ගේ අවශ්‍යතා පිළිබඳ සුවිශේෂී අවධානයක් යොමු කිරීමටත්,සම අවස්ථා ලබා දීමටත්,දරුවන්,ගුරුවරුන්,දෙමාපියන්,ප්‍රජාව ඒකාබද්ධ වෙමින් පවතින ගැටලු වලට විසඳුම් සෙවීමටත් හැකියාවක් ලැබේ.එබැවින් මෙම උපදෙස් සංග්‍රහය මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා බෙහෙවින් ම ප්‍රයෝජනවත් වෙනු ඇත.

එමෙන්ම මුල් ළමාවියේ දරුවන් පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා මෙම උපදෙස් සංග්‍රහය සකස් කිරීම මෙන්ම විවිධ සේවාවන් හා වැඩසටහන් දරුවන්,ගුරුභවතුන් හා දෙමව්පියන් වෙත ලබා දීමෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වලින් මුල් ළමාවිය පළාත් කාර්යාලයට ලැබුණු සහය පිළිබඳ කෘතඥ වෙමි.

ජී.ඒ.එම්.එස්.පී.අඹන්වල

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

# <u>මුල් ළමාවිය සංවර්ධන අධිකාරියේ නිසි බලධාරිතුමාගේ පණිවුඩය</u>

රටේ අනාගත පරපුර නිසි මඟට ගෙන ඒමේ මධ්‍යස්ථානයක් ලෙස හඳුන්වන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන යුගයේ අවශ්‍යතාවයට ගැලපෙන ආකාරයට ගෙන ඒම අප කාගේත් වගකීම වේ.මේ සඳහා යුනිසෙෆ් ආයතනය 2016 වර්ෂයේ වාර්ෂික සැලැස්ම තුළින් හඳුන්වා දී ඇති මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල **"දෙමාපිය සංවර්ධන සමිති"** පිහිටුවීම ඉතාමත් වැදගත් අංශයක් බව සතුටින් සඳහන් කරමි.

ඌව පළාත් මුල් ළමාවිය ප්‍රඥප්තිය අනුව දරුවකුගේ මුල් ළමාවිය වශයෙන් සැලකෙන්නේ වයස අවුරුදු පහ සම්පූර්ණ වන තෙක් කාල සීමාව වේ. එම කාල සීමාව තුළ මුල් ළමාවිය සංවර්ධනය සඳහාත් ඊට නිසි මඟ පෙන්වීම සඳහාත් යන පරමාර්ථයන් ඉටු කර ගැනීමට සුදුසු නෛතික ආයතනයක් හා පරිපාලන ව්‍යුහයක් ගොඩනැගීම අපගේ ඒකායන අරමුණයි.මෙම අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට නම් මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ගුරුවරියන් හා දෙමාපියන් එක්ව නිවැරදි තීරණ ගැනීමෙන් හා ධනාත්මක ආකල්ප තුළින් ගුණාත්මක මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් බවට පත්කර ගත හැකි ය .

ඒ සඳහා මෙම ව්‍යවස්ථා සංග්‍රහය සකස් කිරීමට මූල්‍ය අනුග්‍රහය ලබා දුන් යුනිසෙෆ් ආයතනයට ද අදහස් හා උපදෙස් ලබා දුන් අධ්‍යාපන අමාත්‍යාංශයට හා සියලු සම්පත්දායකයන්ට මාගේ ස්තුතිය පිරිනමමි.

ආනන්දසිරි ගොඩකන්ද

නිසි බලධාරි

මුල් ළමාවිය සංවර්ධන අධිකාරිය

ඌව පළාත

# මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සඳහා දෙමාපිය සංවර්ධන සමිති

# ව්‍යවස්ථා සංග්‍රහය තුළ අන්තර්ගතය

1) හැඳින්වීම
2) අරමුණු
3) අපේක්ෂිත ප්‍රතිඵල
4) මුල් ළමාවිය සංවර්ධන සමිතියේ ව්‍යුහය
5) සමිතියේ නිලතල හා කාර්යභාරය
6) නිල කාලය
7) රැස්වීම් පවත්වන ආකාරය
8) මූල්‍ය කළමනාකරණය

# හැඳින්වීම :

මුල් ළමාවිය සංවර්ධන අවදියේ පසුවන සෑම දරුවෙක් සඳහාම ගුණාත්මකව භෞතික හා මානව සම්පත් ලබා දෙමින් මුල් ළමාවිය සංවර්ධනයේ ප්‍රතිලාභ සම අවස්ථා ලබා දීම තුළින් ඌව පළාත තුළ ප්‍රතිපත්ති රාමුවක් පිහිටුවා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන මට්ටමේ තීරණ ගැනීම සඳහා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන බල ගැන්වීම අවශ්‍යය වී ඇත.

ඒ අනුව මුල් ළමාවිය සංවර්ධන අරමුණු ඉටු කර ගැනීමට මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ගුරුවරගුරුවරියන් හා දෙමාපියන් ඇතුළු සමස්ත පෙර පාසල් ප්‍රජාවගේ පූර්ණ සහභාගීත්වය ඇතිව පාරදෘශ්‍ය භාවයෙන් යුතු කළමනාකාරීත්වයක් සහිත කාර්යක්ෂම මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීම කාලීන අවශ්‍යතාවයකි.

## අරමුණු:

- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වල මූලික අවශ්‍යතා ප්‍රමුඛතාකරණයකට ලක්කර එම අවශ්‍යතා සපුරා ගැනීමට යොමු කිරීම
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වල ළමුන්ගේ කුසලතා ගුණාත්මක වශයෙන් වැඩි දියුණුව සඳහා පවත්නා සම්පත් ඵලදායි ලෙස යොදා ගැනීම.
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වල කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම.
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හා ප්‍රජාව අතර අන්‍යෝන්‍යය සබදතාවය ශක්තිමත් කිරීම
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වල මූල්‍ය කළමනාකරණය පිළිබඳ පාරදෘශ්‍යභාවය ඉහළ නැංවීම
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වල දරුවන්ගේ සුභ සාධනය සඳහා කටයුතු කිරීම.
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වල උන්නතිය වෙනුවෙන් ප්‍රජා දායකත්වය ලබා ගෙන තීරණ ගැනීමේ අවස්ථාව ලබා දීම.

## අපේක්ෂිත ප්‍රතිඵල :

- පාරදෘශ්‍ය හා නම්‍යශීලී කළමනාකාරීත්වය
- ප්‍රජාවගේ අවශ්‍යතා සඳහා සකස් වූ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන ඇති කිරීම
- දරුවාගේ අධ්‍යාපනය හා මනෝ සාමාජීයත්වය ඇතිකරවන මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් නිර්මාණය කිරීම.
- ළමා මිතුරු මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයක් ඇති කිරීම.
- මුල් ළමාවිය සංවර්ධනය සඳහා සාමූහික ප්‍රවේශයක් ගැනීම.
- සමස්ත මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල මෙම ව්‍යවස්ථා සංග්‍රහය ක්‍රියාත්මක කිරීම.

# <u>මුල් ළමාවිය සංවර්ධන සමිතියේ ව්‍යුහය</u>

මුල් ළමාවිය සංවර්ධන සමිතියේ සාමාජිකත්වය :

මධ්‍යස්ථානයට ඇතුළත් කරන දරුවාගේ දෙමාපියන් හා නීත්‍යානුකූල භාරකරු
(දෙමාපියන් ගෙන් එක් අයෙක් පමණක් සාමාජිකයෙක් ලෙස හඳුන්වයි)

මුල් ළමාවිය සංවර්ධන සමිතියේ නිලතල :

1. සභාපති
2. ලේකම්
3. උප සභාපති
4. උප ලේකම්
5. භාණ්ඩාගාරික
6. කාරක සභාව
7. ගිණුම් පරීක්ෂක
8. අනුශාසකවරු;
    - ආගමික නායකයෙක්
    - ග්‍රාම නිලධාරි
    - මුල් ළමාවිය සංවර්ධන නිලධාරි
    - ළමා ලේකම් කාර්යාලයේ මුල් ළමාවිය සංවර්ධන සහකාර
    - ආසන්න ප්‍රාථමික පාසලේ විදුහල්පති

## සමිතියේ නිලතල හා කාර්යභාරය:

**සභාපති** : මෙම සමිතියේ සභාපති ලෙස නිල බලයෙන්ම මධ්‍යස්ථාන භාර ප්‍රධාන ගුරුවරිය හෝ ගුරුවරයා පත්වේ.

කාරක සභාවේ සභාපති ද මොහු වේ.

කාර්යභාරය :

1. සෑම වර්ෂයකම ආරම්භක සති 2 ඇතුළත දෙමාපිය රැස්වීමක් කැඳවා මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල දෙමාපිය සංවර්ධන සමිතිය පිහිටුවීම.
2. ව්‍යවස්ථානුකූලව නිලධාරි මඬුල්ලක් පත් කිරීම.
3. සමිතිය මෙහෙය වීම.
4. සමිතියේ සියලු ලේඛන නඩත්තු කිරීම හා ආරක්ෂිතව පවත්වා ගෙන යාම.
5. මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ තොරතුරු මුල් ළමාවිය සංවර්ධන අධිකාරියට හෝ ඉහළ නිලධාරීන්ට සැපයීම.
6. කාරක සභාව විශේෂ අවස්ථා මත කැඳවීම හා එහි දී ගනු ලබන තීරණ ඊළඟ සමිතියේ දී දැනුම් දීම.
7. බැංකු කටයුතු වලදී පළමු අත්සන්කරු ලෙස කටයුතු කිරීම.

**ලේකම්** : සමිතියේ බහුතර කැමැත්ත මත යෝජනා ස්ථිර කර ගැනීමෙන් දෙමාපියන් ගෙන් අයෙක් ලේකම්වරයෙක් හෝ ලේකම්වරියක් ලෙස පත් කර ගැනීම.

කාරක සභාවේ ලේකම් ද මොහු වේ.

කාර්යභාරය :

1. සභාපතිගේ දැනුම් දීම මත සාමාජිකයින් කැඳවීමේ වගකීම.
2. සෑම රැස්වීමකම වාර්තා තබා ගැනීම.
3. සාමාජික නාම ලේඛන හා අනෙකුත් ලිපි ලේඛන විධිමත්ව නඩත්තු කිරීම.
4. සෑම මහ සභා රැස්වීමකදී හා කමිටු රැස්වීමකදීම පසුගිය සමිති වාර්තාව ඉදිරිපත් කිරීම.

**භාණ්ඩාගාරික** : බහුතර කැමැත්ත මත දෙමාපියන් ගෙන් අයෙක් භාණ්ඩාගාරික ලෙස පත්කර ගැනීම.

කාර්යභාරය :

1. මහ සභාව විසින් තීරණය කරන වාර්ෂික සාමාජික මුදලක් අය කිරීම හා ඒ සඳහා ලදු පතක් නිකුත් කිරීම.

2. සෑම මාසයකම මුල් සතියේ පෙර පාසල් ගාස්තු අය කිරීම.
3. වර්ෂාරම්භයේ දී පෙර පාසල් සඳහා ඇතුල් කිරීමේ ගාස්තු එකතු කිරීම.
4. මූල්‍ය වශයෙන් ලැබෙන සියලු ලැබීම් සඳහා ලදු පතක් නිකුත් කිරීම.
5. මෙම සියලු මුදල් රාජ්‍ය සතු බැංකුවක පෙර පාසලේ නමින් ගිණුම් ගත කිරීම.
6. බැංකු කටයුතු වලදී දෙවන අත්සන්කරු ලෙස කටයුතු කිරීම.
7. මූල්‍ය කටයුතු වලට අදාල පහත ලේඛන නඩත්තු කිරීම.
    I. මුදල් භාර ගැනීමේ ලදුපත් පොත
    II. මුදල් පොත
    III. වාර්ෂික අයවැය වාර්තාව
    IV. තොග පොත්
    V. ගෙවීම් වවුචර්
8. සුළු මුදල් පොතක් නඩත්තු කිරීම.
9. සුළු මුදල් පොත සඳහා රු:2,000/= තබා ගැනීම.
10. මධ්‍යස්ථානයට අවශ්‍යය භෞතික හා වෙනත් අවශ්‍යතා කාරක සභා අනුමැතියට යටත්ව මිළ දී ගැනීම හෝ මුදල් වැය කිරීම.

**උප සභාපති:** සභාපති නොමැති අවස්ථාවල දී සභය ගුරුවරිය හෝ දෙමාපියන් විසින් පත් කර ගන්නා අයෙක් මූලාසන කටයුතු දැරිය යුතුය.

**උප ලේකම් :** ලේකම් නොමැති අවස්ථාවල දී ලේකම්ගේ තනතුරේ වැඩ ආවරණය කිරීම.

**කාරක සභාව:** කාරක සභා සාමාජික සංඛ්‍යාව

මුල් ළමාවිය මධ්‍යස්ථානයක ළමුන් සංඛ්‍යාව 1-20 අතර නම් කාරක සභා සංඛ්‍යාව 2කි. 1-40 අතර නම් කාරක සභා සංඛ්‍යාව 4කි.60ට වැඩි නම් 6ක් හා 80ට වැඩි නම් 8ක් ද වශයෙන් සාමාජිකයින් පත්වේ.

සෑම සමිතිවාරයකම කාරක සභා සාමාජිකයින් පැමිණිය යුතුය.

කාර්යභාරය:

1. වර්ෂාරම්භයේ පළමු මාසය තුළ වාර්ෂික සංවර්ධන සැලැස්ම සකස් කර මහ සභාවට ඉදිරිපත් කිරීම.
2. එම සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක වේදැයි වාරිකව සොයා බැලීම.
3. ප්‍රජා සබඳතා සංවර්ධනය කර ගැනීම
4. ආයතනික සබඳතා පවත්වා ගෙන යාම.(රාජ්‍ය නොවන සංවිධාන)
5. අරමුදල් සම්පාදනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

6. කමිටුව විසින් මධ්‍යස්ථානයේ පවතින සියලුම ප්‍රාග්ධන වත්කම් ලේඛනය නඩත්තු කිරීම හා යාවත්කාලීන කිරීම.
7. සමිතියට ලැබෙන මුදල්වලින් උපකරණ ලබා ගැනීම හා අලුත්වැඩියා කටයුතු වලදී නියමිත ප්‍රමිතීන්ට එම කාර්යයන් සිදුවනවා දැයි සොයා බැලීම.

නිල කාලය :

සභාපති හැර අනෙකුත් සියලුම නිලධාරීන්ගේ නිල කාලය වසරකි.එකම තනතුර සඳහා නිල කාලය අඛණ්ඩව වසර දෙකකට නොවැඩි විය යුතුය.

නිල කාලය අහෝසි වන ආකාරය :

- අදාල වර්ෂ දෙක සම්පූර්ණ වීම
- මුල් ළමාවිය මධ්‍යස්ථානයෙන් දරුවා ඉවත් වීම
- සාමාජිකත්වය අහෝසි වීම
- ඉල්ලා අස්වීම
- මිය යාම
- විනය විරෝධී හා විෂමාචාර කටයුතු වල යෙදුණු බවට ඔප්පු වීම
- කාරක සභාවේ නිර්දේශය මත ඉවත් කිරීම
- අධිකාරිය විසින් පනවන ලද නීති රීති උල්ලංඝණය කිරීම

අහෝසි වන නිල කාලය සඳහා නව පත් කිරීම:

කාරක සභාවේ අනුමැතිය මත හා අනුශාසක මණ්ඩලයේ තීරණය මත මාස තුනක කාලයක් ඇතුලත මහ සභාව රැස් වී විධිමත් පරිදි එම හිස් වූ තනතුර අදාල පාර්ශවයන් ගෙන්ම නැවත පත් කිරීම.

<u>රැස්වීම් පවත්වන ආකාරය</u>

මහ සභාවක් වාරයකට අවම වශයෙන් එක් වතාවක් හෝ රැස්විය යුතුය.

සාමාජිකයින්ගේ 2/3 ඉල්ලීම මත කාරක සභාවේ ඉල්ලීම මත මහ සභාව රැස්විය යුතුය.

මූල්‍ය කළමනාකරණය :

මූල්‍ය ප්‍රභවයන්-:

- රාජ්‍ය හෝ අනුමත රාජ්‍ය නොවන සංවිධාන වලින් ලැබෙන ආධාර
- දෙමාපියන්,සුභ පතන්නන්,ආදි ශිෂ්‍යයන් ගේ පරිත්‍යාග,මුල් ළමාවිය සංවර්ධන සමිතියේ සාමාජිකයින් ගෙන් ලැබෙන මුදල්
- කාරක සභාව විසින් තීරණය කරන අරමුදල්
- විශේෂ ව්‍යාපෘති මඟින් ලැබෙන අරමුදල්
- මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානයේ විවිධ ක්‍රියා කාරකම් වලින් උපයන අරමුදල් (සල්පිල්,පොළවල් ආදිය)
- පළාත් සභා අරමුදල් වලින් ලැබෙන මුදල්

ඉහත සඳහන් කළ මූල්‍ය ප්‍රභවයන් අභිබවා දෙමාපියන් ගෙන් හා දරුවන් ගෙන් මුදල් අය කිරීම නොකළ යුතුය.

unicef